# නෙත් FM

# 5 පහේ පන්තිය

01 ලොකු බීම බෝතලයක බීම ලීටර 1 මිලිලීටර 500ක් තිබේ. එයින් වීදුරු හයක් පිරවිය හැකි ය. වීදුරුවකට අල්ලන බීම ප්‍රමාණය කොපමණ ද?

මිලිලීටර ...............................................................................

02 යතුරුපැදියක් පෙට්‍රල් ලීටරයකින් 60 kmක් ගමන් කළ හැකි ය. මෙම යතුරුපැදියෙන් 105 kmක දුරක් යාමට පෙට්‍රල් කොපමණ අවශ්‍ය ද?

ලීටර.................................මිලිලීටර.........................................

03 එක් ඇඳ ඇතිරිල්ලක මිල රුපියල් 425.00කි. ඒවා 5කට වඩා ලබා ගන්නා විට එකකින් රුපියල් 40.00ක් අඩු වේ. ඇතිරිලි 7ක් මිලට ගත් අයෙක් ගෙවිය යුතු මුදල කීය ද?

රුපියල් ...............................................................................

04 2020.02.15 දාට සඳුන්ට වයස අවුරුදු 12කි. එසේ නම් ඔහු උපන් වර්ෂය කුමක් ද?

...............................................................................

05 පාන් ගෙඩියක් තිදෙනෙකුට සෑහේ නම් 26 දෙනෙක් සඳහා ආහාර සැපයීමට පාන් ගෙඩි කීයක් අවශ්‍ය ද?

...............................................................................

06 දුම්රියෙන් නුවර සිට මාතරට ගිය රමණී ඇයට ඒ සඳහා පැය 10 මිනිත්තු 30ක් ගත වූ බව කීවා ය. ඇය මාතර දුම්රිය ස්ථානයෙන් බසින විට වේලාව පස්වරු 5.30 විය. ඇය ගමන ඇරඹූ වේලාව කීය ද?

...............................................................................


07 ලණුවක දිග 12 m 40 cm වේ. එම ලණුවේ දිරාපත් වූ 2 m 70 cm ප්‍රමාණයක් කපා ඉවත් කරන ලදී. ඉතුරු ලණු කැබැල්ලේ දිග කොපමණ ද?

.......................................... m .......................................... cm

**08** උතුරු දිශාවට මුහුණ ලා සිටි ජගත් A නම් ස්ථානයෙන් ගමන් අරඹා 200 mක් තම වම් අත පැත්තට ගමන් කළේ ය. පසුව උතුරු දිශාවට තවත් 200 mක් ගමන් කර නතර විය. ජගත් දැන් සිටිනුයේ A සිට කුමන දිශාවෙන් ද?

.................................................................

★ එක්තරා වෙළෙඳසැලක අලෙවි වූ ආහාර ද්‍රව්‍ය පිළිබඳ විස්තර පහත ප්‍රස්තාරයේ දැක්වේ. ඒ අනුව අංක 09 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




**09** මාළු පාන් ගෙඩි 22ක් අලෙවි වූයේ නම් එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

**10** පාන් ගෙඩියක් රු. 60.00කට අලෙවි කිරීමෙන් වෙළෙන්දා රු 5.00ක ලාබයක් ලබයි. ඔහු පාන් අලෙවියෙන් ලද ලාබය කොපමණ ද?

රුපියල් .................................................................

★ පහත මිල දර්ශනයට අනුව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| වර්ගය | ප්‍රමාණය | මිල |
|---|---|---|
| හාල් | 1kg | 85.00 |
| පරිප්පු | 500g | 85.00 |
| සීනි | 1kg | 140.00 |


**11** හාල් 2kg හා පරිප්පු 250g සමග සීනි 500g මිලට ගත් අයෙක් ගෙවිය යුතු මුළු මුදල කීය ද?

රුපියල් .................................................................

**12** 3143 යන සංඛ්‍යාවේ සියයස්ථානයේ අගය දෙගුණයක් කළ විට සෑදෙන නව සංඛ්‍යාවත් 3143ත් අතර වෙනස කොපමණ ද?

.................................................................

★ P,Q,R,S,T යන නගර සම්බන්ධ කර සාදා ඇති පාරවල්වල දිග පහත සිතියමේ දැක්වේ. ඒ අනුව අංක 13 සහ 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




මෙහි ඇති P, Q, S යන නගර තුන එකිනෙකට සමාන දුරින් පිහිටා ඇත.

**13** P, Q, R, S හරහා T වෙත යන අයෙක් පසු කර යා යුතු දුර කොපමණ ද?

..........................................................................km

**14** ඔහු එම ගමන P සිට S හරහා T වෙත ගියේ නම් ගමනේ දුර පෙර වතාවට වඩා කොපමණ අඩුවේ ද?

..........................................................................km

**15** අලි පැටවුන් දෙදෙනෙක් ප්‍රවාහනය සඳහා සකස් කර තිබූ ලොරියක බර 1800 kgක් වේ. එයට පිළිවෙළින් 500 kgක් හා 600 kgක් බැගින් වූ අලි පැටවුන් දෙදෙනෙක් නංවන ලදී. දැන් අලි පැටවුන් සමඟ ලොරියේ බර කොපමණ ද?

..........................................................................kg